**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

**අන්තර්මධ්‍ය විභාගය - ජූලි 2011**

## (55) තොරතුරු කළමනාකරණය හා ව්‍යාපාරික භාවිතය

(Information Management & Application in Business)

මෙවර ප්‍රශ්න පත්‍රය ඉතා කාලෝචිත මෙන්ම ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයක් ඉදිරිපත් කර තිබුනි. බොහෝ තොරතුරු තාක්ෂණය හදාරණ සිසුන් මගින් ප්‍රායෝගික මෙන්ම න්‍යායාත්මක දැනුම වර්තමානයේ ඉතා ඉහල තත්ත්වයක පවතින බැවින් ඔවුන් බොහෝ ප්‍රමාණයක් පහසුවෙන් පිළිතුරු ලියා ඇති ආකාරයක් පෙනුනි.

B කොටසේ ප්‍රශ්න 6 න් 4 කට පමණක් පිළිතුරු සැපයිය යුතු නිසා වැඩි සිසුන් ප්‍රමාණයක් ළමුන්ගෙන් වැඩි ප්‍රමානයක් 5 වන හd 6 වන ප්‍රශ්නය අතහැර තිබුනි.

සමස්ත වශයෙන් සලකා බලන කල ඉතා හොඳින් පිළිතුරු ලබාදිය හැකි ප්‍රශ්න පත්‍රයක් සිසුන් වෙත ලබාදී ඇති බවත් බොහෝ සිසුන් ප්‍රමානයක් ඉන් උපරිම ප්‍රයෝජනයක් ලබාගෙන ඇති බවත් දැක්විය හැක.

## A - කොටස

**බහුවරණ ප්‍රශ්න**

**ප්‍රශ්න අංක 01 -** ලකුණු 40

(අනිවාර්ය ප්‍රශ්නයකි.)

ප්‍රශ්නය බහුවරණ වූ අතර ලකුණු 40 ම ලබාගත් ළමුන්ද බොහෝ ප්‍රමානයක් සිටියහ. එම ප්‍රශ්නයට ඉතා වැඩි ලකුණු ලබාගැනීම සිසුන් ඉතා ඉහලම අගයක් ගත් අතර එමගින්ම ඔවුන් ප්‍රශ්න පත්‍රයේ සමත්වීමේ ලකුනු වෙත නිතැනින්ම ළඟාවී තිබුනි.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 -** ලකුණු 15

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

වැඩි සිසුන් ප්‍රමාණයක් නිවැරදි පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නයෙන් අසා තිබුනේ තොරතුරුවල ගති ලක්ෂණ, කළමනාකරණ මට්ටම් අනුව තොරතුරු වර්ගීකරණය, ශ්‍රිතමය ක්ෂේත්‍ර පදනම මත භාවිත කල හැකි තොරතුරු වර්ග වේ.

a. වැඩි සිසුන් ප්‍රමාණයක් සැළකිය යුතු මටට්මකට ලකුණු ලබාගෙන තිබුණි. ලක්ෂන නොවන කරුණුද සමහරු විස්තර වශයෙන් ලියා තිබුණි.

b. වැඩි සිසුන් ප්‍රමාණයක් ඉහල ලකුණු ලබා තිබුණි. මෙම කොටස සඳහා සමහර ශිෂායින් තොරතුරු පද්ධති පිළිබඳ කරුණු උදා: DSS ආදියේ තොරතුරුද ඇතුළත් කර තිබුනි. නිවැරදිව ප්‍රශ්නය තේරුම් ගෙන නොතිබුනි.

c. වැඩි සිසුන් ප්‍රමාණයක් ඉහල ලකුණු ලබාගෙන තිබුනි.

සමස්තයක් ලෙස ගත් කල ශිෂායින් තවදුරටත් විෂය පිළිබදව අධ්‍යයනය කර පිළිතුරු ලිවීමට දැනුවත් වන්නේ නම් වැඩි ලකුණු ලබා ගත හැකිය. එසේම ශිෂායින්ට දැනුම වර්ධනය කරගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම වඩා යෝග්‍යය.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙමගින් අසා තිබුනේ තොරතුරු තාක්ෂණය, හස්ත තොරතුරු පද්ධතිවලට වඩා පරිගණක තොරතුරු පද්ධති වල වාසි, CBIS හඳුන්වා දීමත් භාවිතා කිරීමත් ආශ්‍රිතව තිබෙන පිරිවැය 2ක්, කළමනාකරණ තොරතුරු පද්ධතියකට කළමනාකරුවන් භාවිතාකරන තුන්වර්ගයක වාර්ථා නම් කිරීම වේ.

a. මෙම ප්‍රශ්නය සඳහා සෑම ශිෂ්‍යයෙකුම පිළිතුරු සපයා ඇත. නමුත් මෙහි පැහැදිලි පිළිතුරක් සැපයීමට සමත්ව ඇත්තේ 60%ක් පමණි. මෙයින් පෙනී යන්නේ සිද්ධාන්ත හරිහැටි අවබෝධ කරගෙන නොමැති බවයි. සිද්ධාන්ත මීට වඩා ළමයින් අවබෝධ කරගත යුතු බව මෙමගින් පෙනී යයි.

b. එම කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබාගැනීමට බොහෝ සිසුන් සමත් වීඇත.

c. මෙම ප්‍රශ්නය සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු ලබාදීමට සමත් වී ඇත. මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගැනීමට බොහෝ සිසුන් සමත්ව ඇත. මෙය ඉතාම පහසුවෙන් පිළිතුරු දීමට හැකි ප්‍රශ්නයකි.

d මෙම ප්‍රශ්නය සඳහා සාර්ථක පිළිතුරු ලබාදීමට වැඩි සිසුන් ප්‍රමාණයකට නොහැකි වී ඇත. මෙම ප්‍රශ්නය නිවැරදිව හඳුනාගෙන නැත. එබැවින් ඒ සඳහා නිසි පිළිතුරු ලැබී නැත.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

වැඩි සිසුන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය කිරීමට උත්සාහ දරා තිබුනි. මෙමගින් දැනට භාවිතයේ අමතර පරිගණක පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත.

a. කෘතිම බුද්ධිය යන වචනය බොහෝ සිසුන් හොඳින් තේරුම් ගෙන පිළිතුරු සපයා තිබුනි.

b. මෙම ප්‍රශ්නය ඉතාම පහසු ප්‍රශ්නයකි. නූතන ව්‍යාවහාරයේ මෙම වර්ග දෙකේම පරිගණක භාවිතා වන බැවින් ඉතා හොඳින් සිසුන් පිළිතුරු සපයා මුළු ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුනි.

c. මෙයද ඉතා විවෘත තොරතුරු තාක්ෂණ ප්‍රශ්නයක් වන අතර දැන් අන්තර්ජාලය හරහා විවෘතකේත මෘදුකාංග නොමිලේම ලබාගත හැකි බව සිසුන් දැනුවත්ව තිබුනි. එමනිසා පිළිතුරු සාර්ථකව ලියා තිබුනි.

d මෙම කොටස සඳහා පිළිතුරු සැපයීම ඉතා දුර්වල මටට්මක තිබුනි. "Output Controls" යන වචනය ඔවුන්ට තේරුම් ගත නොහැකි ආකාරයක් පිළිතුරු වලින් පෙනේ. බොහෝ සිසුන් ලියා ඇත්තේ Computer Outputs ගැනයි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු දක්වා තිබුනේ සමස්ත සිසුන්ගෙන් 20% කටත් අඩු පිරිසකි. තොරතුරු තාක්ෂණ විෂයයේ මූලික න්‍යායත්මක දැනුම, තොරතුරු තාක්ෂණ විෂයයයේ සුලබව යොදාගන්නා ක්‍රමයක් පිළිබදව දැනුම, අන්තර්ජාලයේ හා ජාලවල යොදාගන්නා ප්‍රායෝගික භාවිතාවන් පිළිබදව තේරුම විමසා ඇත.

a. තොරතුරු තාක්ෂණ විෂයයයේ මූලික න්‍යායත්මක දැනුම. තෝරාගත් අයගෙන් පිළිතුරු සාර්ථක පිළිතුරු සපයා තිබුණි.

b. තොරතුරු තාක්ෂණ විෂයයේ සුලබව යොදාගන්නා ක්‍රමයක් පිළිබදව දැනුම. තෝරාගත් අයගෙන් සමහරු රූප සටහන නොමැතිව විස්තර කර තිබුනි. 50% පමණ රූප සටහන ඇඳ තිබුනි. මූලාකෘති යොදාගැනෙන විට අනුගමනය කරන පියවර සියල්ල නොදැනීම නිසා සමහර සිසුන් නිවැරදිව පිළිතුරු දී නොතිබුණි.

c. අන්තර්ජාලයේ හා ජාලවල යොදාගන්නා ප්‍රායෝගික භාවිතාවන් පිළිබඳව තේරුම නිවැරදි පිළිතුරු ඉතාම කලාතුරකින් දක්නට ලැබුනි.

පිළිතුරු ලිවීම සඳහා අඩුවෙන්ම තෝරාගෙන තිබූ ප්‍රශ්නයයි. (b) කොටසේ රූපසටහන ඇඳීමට නොදැනීම (c) (i) කොටසේ තේරුම නොදැනීම ප්‍රශ්නය අඩුවෙන් තෝරා ගැනීමට තවත් හේතුවකි.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නයට සිසුන් 50% ක් පමණ අතහැර දමා තිබුනි. මෙම ප්‍රශ්නය මගින් පරිගණක තොරතුරු පද්ධතිවල තර්ජන පිළිබඳවත්, තොරතුරු පද්ධතිවල ආරක්ෂණ පද්ධති ගැනත් විමසා බලා ඇත.

a. බොහෝ සිසුන් නිවැරදි පිළිතුරු සපයා ඇත. සමහර අය ස්වභාවික උවදුරු ගැන නොසිතා අනිකුත් උවදුරු පිළිබඳව ලියා තිබුණි.

b. ඉතාමත් ස්වල්ප සිසුන් ප්‍රමාණයක් නිවැරදි පිළිතුරු සපයා තිබුනි. "නැත" යන පිළිතුර පමණක් ලියා එයට හේතු දැක්වීමට සිසුන් අසමත් වී තිබුණි.

c. පිළිතුරු සපයා ඇති සිසුන්ගෙන් අඩක් පමණ නිවැරදිව පිළිතුරු ලියා ඇත. පිළිතුරු ලියා ඇති ඇතැම් සිසුන් කිසිම විශ්වාසයක් නොමැතිව පිළිතුරු ලියා ඇති බවද පෙනුනි. ඔවුන්ට ගැටළු සහිත ප්‍රශ්නයක් ලෙස හැඳින්විය හැක.

d IDS වචනය බොහෝ සිසුන් නිවැරදිව නොදන්නා බව පිළිතුරු වලින් පෙනේ. එම නිසා මෙයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ ඉතාම අල්ප ප්‍රමාණයකි.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නයෙන් පැතුරුම්පත් සැකසුමක් ඇසුරින් එක් එක් සේවකයාගේ සති අන්තයක වැඩකළ අතිකාල දීමනා සැකසීම, වෙළඳපොලින් කෙලින්ම ගබාගත හැකි ගිණුම්කරණ මෘදුකාංග 03ක්, වෙබ් පෝර්ටල් මගින් ඉටුකෙරෙන කාර්යය කෙටියෙන් පැහැදිලි කිරීම විමසා තිබුණි.

a. මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුනු සිසුන් අතරින් වැඩි සිසුන් ප්‍රමාණයක් මෙම කොටසට අදාළ සූත්‍ර නිවැරදිව දක්වා තිබුනි.

b. ඉතා පහසු ප්‍රශ්න කොටසක් වන මෙම කොටස සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් නිවැරදිව පිළිතුරු සපයා තිබුනි. විෂය කරුණුවලට අදාළ ප්‍රශ්න කොටසක් වන බැවින් මෙය සිසුන්ට ඉතා පහසුවී තිබුනි.

c. සමස්ත ප්‍රශ්නයෙන් අසාර්ථකම පිළිතුරු සපයා තිබුනේ මෙම කොටසටයි. වෙබ් පෝටල් වෙනුවට අන්තර්ජාලය, අන්තර්ජාලය හරහා සිදුකෙරෙන ගණුදෙනු ආදී විවිධ කරුණු ගැන විස්තර කර තිබුනි. වෙබ් පෝර්ටල් යනු කුමක්දැයි නිවැරදි අදහසක් නොමැති වුවත්, එහි කාර්යයන් ගැන යම් අදහසක් දැක්වීමට සමත් වූ අතර උදාහරණ නිවැරදිව දක්වීමට ද සමත් වී තිබුනි.

සමස්තයක් ලෙස ගත් කළ ඉතා හොඳ ප්‍රශ්නයකි. විෂය කරුණු සේම ප්‍රායෝගික දැනුම ඇති සිසුන්ට ඉතා පහසුවෙන් පිළිතුරු ලිවීමට හැකිය.

- * * * -